# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/43 – 2016 ඔක්තෝබර් 07 වැනි සිකුරාදා – 2016.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/13/29/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2011.01.28 වැනි දින අංක 1690/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.01.25 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආනන්ද හේවාගම මහතා, ''විකුම්සිරි'', ගුරුකන්ද, කතළුව, අහංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක. 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර පවත්නා 2010.12.31 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එන්. ඒ. ජයවික්‍රම මහත්මිය වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2011.01.25 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

10 – 1147/1

1A – G 24329 – 77 (2016/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/13/29/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආනන්ද හේවාගම මහතා, ''විකුම්සිරි'', ගුරුකන්ද, කතළුව, අහංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක. 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත, ඒ. පී. ටී. 503, නො. 181/1, ටී. ඊ. සාන්තරාජන් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/29/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආනන්ද හේවාගම මහතා, ''විකුම්සිරි'', ගුරුකන්ද, කතළුව, අහංගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක. 19, පහළ ඩික්සන් පාර, ගාල්ල.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

දැනට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්තව ඉංජිනේරුවරයෙකු වශයෙන් සේවය කරන ආනන්ද හේවාගම මහතා විසින් එම අධිකාරිය වෙතින් කරන පහත සඳහන් ඉල්ලීම් යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවේ නම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවා ද යන්න පිළිබඳව වේ.

01. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 1995. 02. 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 04 ක් සහිතව ඉංජිනේරු III ශ්‍රේණියට උසස් කළ යුතු බව.

02. 1996. 11. 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු II ශ්‍රේණියට උසස් කර, ඒ අනුව හිඟ වැටුප් ලබාදීම කළ යුතු බව.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජුනි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 1147/2

---

මගේ අංකය: IR/22/11/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2011.02.25 වැනි දින අංක 1694/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.02.09 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එස්. මුණසිංහ මහතා, අංක 86 F, බටහිර කලුවාරිප්පුව, කටාන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2011.01.31 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩබ්ලිව්. ජී. ඩීන් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2011.02.09 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

10 – 1148/1

---

මගේ අංකය: IR/22/11/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එස්. මුණසිංහ මහතා, අංක 86 F, බටහිර කලුවාරිප්පුව, කටාන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක 114/1, පී. දනන්සූරිය මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/11/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එස්. මුණසිංහ මහතා, අංක 86 F, බටහිර කලුවාරිප්පුව, කටාන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීගමුව ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටිය දී 2008.11.17 දින සිට කේ. එස්. මුණසිංහ මහතාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් ගම්පහ ප්‍රාදේශිකයේ ජොෂ්ඨ විනය නිළධාරි ගේ විනය නියෝගය හා අනතුරුව එහි අභියාචනා මණ්ඩල සභාපති ගේ අභියාචනා නියෝගය හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේද යන්න සහ අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ."

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 සැප්තැම්බර් මස 3 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 1148/2

---

මගේ අංකය: IR/10/63/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. එස්. එස්. පෙරේරා මහතා, අංක. 305/13, පුවක්ගහහේන, මීගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මේල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/63/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. එස්. එස්. පෙරේරා මහතා, අංක. 305/13, පුවක්ගහහේන, මීගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

“සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 1 වන ශ්‍රේණියේ තත්ත්ව ආරක්ෂක නිළධාරියෙකු ලෙස සේවය කළ අයි. එස්. එස්. පෙරේරා මහතා වැඩ තහනමට ලක්ව සිටි 2002.11.27 දින සිට 2005.02.18 දින දක්වා කාලයට ඔහුට වැටුප් ලබා දෙන ලෙසට කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.”

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10 – 1149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.